





# යාල ජාතික වනෝද්‍යානය

**යූ.පී.එස්.පතිරණ**

**අනේකවිධ ස්වභාව සම්පත් වලින් ආශිර්වාද ලත් ශ්‍රී ලංකාවේ එක් වැදගත් ස්වභාවික සම්පතක් වනුයේ වනසතුන්ය. මිනිස් වාසභූමි හා මිනිස් ක්‍රියාකාරකම් ව්‍යප්තවීමත් සමග ස්වභාවික වනාන්තර හැකිලෙද්දී අද වඩාත් අවදානමට හා විනාශ මුඛයට යොමුවී ඇත්තේද එම වනසතුන්මය. කෙසේ වුවද, වඳවීයාමේ තර්ජනයට මුහුණදී ඇති වනසතුන්ට යම්තරමකින් හෝ රැකවරණයක් ලබාදීම සඳහා ශ්‍රී ලංකාවේ ජාතික වනෝද්‍යාන 13 ක්ම වෙන්වී තිබීම ජාතියේ වාසනාවකි. ඒ අතර, වඩාත් ජනප්‍රිය ජාතික වනෝද්‍යානය වී ඇත්තේ යාල ජාතික වනෝද්‍යානයයි.**



ශ්‍රී ලංකාවේ විශාලත්වයෙන් දෙවන වනෝද්‍යානය වන වර්තමානයේ රුහුණු ජාතික වනෝද්‍යානය වශයෙන් හැඳින්වෙන යාල ජාතික වනෝද්‍යානය පිහිටා තිබෙන්නේ හම්බන්තොට දිස්ත්‍රික්කයේය. කොළඹ සිට යාලට දුර සැතපුම් 230 ක් පමණ වේ.

මෙම වනෝද්‍යානය ශ්‍රී ලංකාවේ පැරණිම වනෝද්‍යාන අතුරින් එකක් වන අතර, භූමි ප්‍රමාණයෙන් වර්ග කිලෝ මීටර් 389 ක් පමණ විශාල යාල, අභයභූමියක් ලෙසට ප්‍රකාශයට පත්කර ඇත්තේ 1900 දිය. 1938 දී මෙය රුහුණු ජාතික වනෝද්‍යානය ලෙස ප්‍රකාශයට පත්කර ඇත. මෙම වනෝද්‍යානය දැඩි ආරක්ෂිත කලාපයකින්ද නිමලව, කටගමුව හා කතරගම යන අභයභූමි තුනකින්ද සමන්විතය. අද එහි විශාලත්වය වර්ග කිලෝ මීටර් 1207 කි.

කොළඹ සිට ප්‍රධාන මාර්ග තුනකින් යාල වනෝද්‍යානය වෙත

මෙම වනෝද්‍යානය ශ්‍රී ලංකාවේ පැරණිම වනෝද්‍යාන අතුරින් එකක් වන අතර, භූමි ප්‍රමාණයෙන් වර්ග කිලෝ මීටර් 389 ක් පමණ විශාල යාල, අභයභූමියක් ලෙසට ප්‍රකාශයට පත්කර ඇත්තේ 1900 දිය. 1938 දී මෙය රුහුණු ජාතික වනෝද්‍යානය ලෙස ප්‍රකාශයට පත්කර ඇත. මෙම වනෝද්‍යානය දැඩි ආරක්ෂිත කලාපයකින්ද නිමලව, කටගමුව හා කතරගම යන අභයභූමි තුනකින්ද සමන්විතය

ළගාවිය හැකිය. ගාලු පාරෙත් මාතර, හම්බන්තොට,තිස්සමහාරාම හරහා ප්‍රධාන මාර්ගය වැටී තිබේ. දෙවැන්න රත්නපුර මාර්ගයේ පැල්මඩුල්ල, උඩවලව, තණමල්විල, තිස්සමහාරාම හරහාද තෙවැන්න රත්නපුර, පැල්මඩුල්ල, ඇඹිලිපිටිය,හම්බන්තොට හා තිස්සමහාරාම හරහාද ළගාවිය හැකිය. මීට අමතරව වැල්ලවාය බුත්තල කතරගම තිස්සමහාරාම හරහාද පැමිණිය හැකිය.

කොළඹ කතරගම ප්‍රධාන මාර්ගයේ පිහිටි තිස්සමහාරාම නගරයේ සිට කිරින්ද පසුකර කිලෝ මීටර් 09 ක් පමණ ගිය තැන පලටුපාන නම් ස්ථානයේ පිහිටි වනෝද්‍යාන කාර්යාලය හමුවේ. මීට අමතරව කතරගම කටගමුව අභයභූමියේ මායිම් හා යාල වනෝද්‍යානය තුළින් කටගමුව සිතුල්පව්ව බැඹය හරහා වැටී ඇති ජීප්රථ මාර්ගයෙන්ද පලටුපාන දක්වා පැමිණිය හැකිය.ජෛව විවිධත්වය අතින් ඉතා වැදගත් මෙම වනෝද්‍යානය තෙත් මෝසම් වියළි මෝසම් වනාන්තරය, අර්ධ පතනශීලි හා කටු පඳුරු වනාන්තරය හා තණ භූමි ආදි විශාල ගොඩබිම් පද්ධතිද අඩංගු වේ.

යාල වල් අලීන් සඳහා ප්‍රකට අභය භූමියකි. මෙම වනෝද්‍යානය තුළදී වල් අලින් හැරුණුවිට වල් මී හරකුන් හා තිත් මුවන් වැනි විශාල සතුන් පහසුවෙන් දැක බලාගත හැකි නිසා සංචාරකයන් අතර වඩාත් ජනප්‍රිය වී තිබේ. යාල වනෝද්‍යානයේ වන සතුන් පහසුවෙන් දැක බලාගත හැක්කේ වනෝද්‍යානයේ පළමුවන කොටසේ මුහුදුබඩ ප්‍රදේශය තුළදීය. මෙහි ඇති ලවණ ස්වභාවයට වල් අලින් ප්‍රිය කරන නිසා දිය බීමට විශාල වල් අලින් ප්‍රමාණයක් ඇදී එති. යාල වනෝද්‍යානය තුළ වල් අලින්ගේ ජනගහණය 450 – 500 ක් අතර වේ යැයි විශ්වාස කෙරේ. ඉන් 125 – 150 අතර වල් අලින් ප්‍රමාණයක් යාල 1 හා 2 කොටස්වල නිතරම ගැවසේ.

යාල වනෝද්‍යානයේ පළවන හා දෙවන කොටස් වඩාත් ජනප්‍රිය වී ඇත්තේ එය දිවියන්ගේ පාරාදීසයක් වශයෙන් සැලකෙන හෙයිනි. එහිදී වලසුන් ගෝනුන් මීමින්නන්, උරුලෑවන්,හිවලුන්, වල් බළලුන්,වඳුරන්,කලවැද්දන් බහුලව හමුවේ. මේ



**ශ්‍රී ලංකාවේදි හමුවන කැස්බෑ විශේෂ පහම යාල වනෝද්‍යානයේ සමුද්‍රය ආශ්‍රිතව හමුවේ. මෙම වනෝද්‍යානය තුළින් කුඹුක්කන් ඔයත්, මැණික් ගගත් ගලා බසී. ශ්‍රී ලංකාවේ වියළි කලාපය තුළ පිහිටි මෙම වනෝද්‍යානයට ඊසාන මෝසම් සුළඟින් ඔක්තෝබර් සිට ජනවාරි දක්වා කාලය තුළ වර්ෂාව ලැබෙන අතර, වාර්ෂික වර්ෂාපතනය හොඳින් ලැබේ. සාමාන්‍ය උෂ්ණත්වයක් පවතී. යාල වනෝද්‍යානයේ වෘක්ෂලතා ආදිය පිළිබඳව සැළකිල්ලට ගැනීමේ දී වීර, පලු, දිවුල් පුඹුඹ ශාක ලෙසත්, මිල්ල, මිලින්කන්, කුඩුමැල්ල, වා,පනා වැනි අනෙකුත් ශාකද විශේෂයෙන් දැකගත හැකිය.**

අතර කබල්ලෑවන් හා ඉත්තෑවන්ද දැක බලා ගැනීමට හැකිවේ. බොහෝ විට හාවුන් දැකබලාගත හැක්කේ සවස් කාලයේදීය. පක්ෂීන් නිරීක්ෂණය කිරීමටද යාල වනෝද්‍යානය කදිම ස්ථානයකි. මෙහි ශ්‍රී ලංකාවට ආවේණික මෙන්ම සංචාරක පක්ෂීන් රැසකටද නිවහන් සපයා තිබේ. මීට වසර පහකට පමණ පෙර කරන ලද සමීක්ෂණයකට අනුව යාල වනෝද්‍යානය තුළ නේවාසික පක්ෂි විශේෂ 136 ක්ද සංචාරක පක්ෂි විශේෂ 26 ක්ද හඳුනාගෙන තිබේ. ශ්‍රී ලංකාවට ආවේණික පක්ෂීන් වන හබන් කුකුළා හා වලි කුකුළා මෙහි බහුලව හමුවේ. ශ්‍රී ලංකාවේ දැකිය හැකි විශාලම පක්ෂීන් දෙදෙනෙකු වන බහුරු මානාවා හා අලි මානාවද මෙහිදී දැකිය හැකිය. ජලජ ජීවීන් අතර අළු පැස්තුඩුවන් පුංචි දියකාවුන් හා ලතුවැකියන්ද වේ. මෙහිදී බහුලව දැකිය හැකි පක්ෂීන් අතරට ගව කොකා, කුඩා ඇලි කොකා, සුදු මැදි කොකා,මහසුදු කොකා හ කණ කොකාද ඇතුළත් වේ. සංචාරක පක්ෂීන් අතර සියක්කාරයා , අව්ච්ච්යා, විලිබිල්ලා, කැලෑ හැල පෙන්දද බහුලව නිරීක්ෂණය කළ හැකිය.

ශ්‍රී ලංකාවේදි හමුවන කැස්බෑ විශේෂ පහම යාල වනෝද්‍යානයේ සමුද්‍රය ආශ්‍රිතව හමුවේ. මෙම වනෝද්‍යානය තුළින් කුඹුක්කන් ඔයත්, මැණික් ගගත් ගලා බසී. ශ්‍රී ලංකාවේ වියළි කලාපය තුළ පිහිටි මෙම වනෝද්‍යානයට ඊසාන මෝසම් සුළඟින් ඔක්තෝබර් සිට ජනවාරි දක්වා කාලය තුළ වර්ෂාව ලැබෙන අතර, වාර්ෂික වර්ෂාපතනය හොඳින් ලැබේ. සාමාන්‍ය උෂ්ණත්වයක් පවතී.යාල වනෝද්‍යානයේ වෘක්ෂලතා ආදිය පිළිබඳව සැළකිල්ලට ගැනීමේ දී වීර, පලු,දිවුල් පුඹුඹ ශාක ලෙසත්, මිල්ල, මිලින්කන්,කුඩුමැල්ල, න,පනා වැනි අනෙකුත් ශාකද විශේෂයෙන් දැකගත හැකිය. මීට අමතරව ඖෂධීය වටිනාකමකින් යුතු බිංකොහොඹ, නිලාවේරිය, විෂ්ණුක්‍රාන්ති, තිරමුල්ලිය වැනි පැළෑටි ඇතුළත් ශාක විශේෂ 300 ක් පමණ හඳුනාගෙන තිබේ.

යාල වනෝද්‍යානයේ ගිණිකොන පිහිටියේ කුමන කුරුළු අභයභූමියයි. වත්මන් සාම ක්‍රියාදාමයේ ප්‍රතිඵලයක් වශයෙන් දැන් එය සංචාරකයන්ට විවෘත වී තිබේ. වනෝද්‍යානය තුළ මගුල් මහා විහාරය හා සිතුල්පව්ව වැනි ඓතිහාසික වටිනාකමකින් යුත් ස්ථාන රැසක් පිහිටා තිබේ.

සංචාරකයන් සඳහා දැනට විවෘතව පවතින්නේ පළමුවන කොටස මැණික් ගඟ පිහිටි දෙවන කොටස නැරඹීම සඳහා විශේෂ අවසරයක් ලබාගත යුතු වේ. නේවාසික පහසුකම් ලබාගැනීමට සංචාරක නිවාස 07 ක් ද කඳවුරු පැවත්වීම සඳහා පහසුකම්ද යාල වනෝද්‍යානය තුළ වේ. ඒවා වෙන්කරවා ගැනීම සඳහා වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙන් විමසිය යුතුව ඇත.

ශ්‍රී ලංකාවේ වැදගත් පාරිසරික පද්ධතියක් වශයෙන් යාල ජාතික වනෝද්‍යානයෙහි පැවැත්ම හා පාරිසරික තුල්‍යතාවය උදෙසා වර්තමානයේ එල්ල වී ඇති බලවත් තර්ජනද මෙහිදී අමතක කළයුතු නොවේ. ජාතික වනෝද්‍යනයකට ඇතුළු වූ විට පිළිපැදිය යුතු නීතිරීති කොතෙකුත් තිබුණද, ඒවා නුට්ටුවකටද මායිම් නොකර අසංවරව හැසිරෙන සමහර තරුණ කණ්ඩායම් මෙන්ම විශේෂයෙන් පාසල් නිවාඩු කාලවලදී හා දිනු සති අන්ත නිවාඩු දිනයන්හිදී වැල නොකැඩී ඇදී එන දේශීය සංචාරකයන් හා විශාල වාහන සංඛ්‍යාව නිසාද මෙහි සංවේදී පරිසරයට පමණක් නොව එහි වනසතුන්ගේ නිදහසටද දැනටමත් එල්ල වී ඇති තර්ජනද සුළුකොට සැලකිය යුතු නොවේ. මේ පිළිබඳව සංචාරකයන් පමණක් නොව ජාතික වනෝද්‍යනය ආශ්‍රිත ප්‍රතිලාභ ලබන ජනතාව නොපමාව දැනුවත් නොවුන හොත් මෙම වැදගත් පද්ධතිය ජාතියට අහිමි වීමේ දිනය වැඩි දුරක නොවන බව ද අවසාන වශයෙන් සඳහන් කළ යුතුව ඇත. ❑